# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

Article 12(1)

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2019/07/19 |
|---|---|---|

පැමිණිලිකරු : බී.පී.ඒ. හේමකුමාර මයා.
සී 1, වෙළන්ගල්ල,
ගැටහැත්ත, අවිස්සාවේල්ල.

වගඋත්තරකරුවන් :

01 එම්.එච්.කේ.බී මහගෙදර මයා
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය,
අම්පාර.

02 පවිත්‍ර දයාරත්න මයා
සහකාර පොලිස් අධිකාරී (I),
සහකාර පොලිස් අධිකාරී කාර්යාලය,
පොතුවිල්.

03 ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
පානම.

04 යූ.ජී. චන්ද්‍රකුමාර මයා,
ස්ථානාධිපති (රථවාහන අංශය),
පොලිස් ස්ථානය, පානම.

<u>පැමිණිලි අංකය : **HRC/AM/95/14/B**</u>

පැමිණිල්ල :-

උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2014-01-22 දිනැති අම්පාර සහකාර පොලිස් අධිකාරීවරයාගේ අංක 117/2014 දරණ නියෝග පරිදි පානම පොලිස් ස්ථානයේ රථවාහන අංශයට අනුයුක්තව



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com

සාමාන්‍ය රාජකාරි වල යෙදී සිටියදී 2014.08.25 දිනැතිව අම්පාර මෙහෙයුම් මැදිරියේ දූරකථන පණිවිඩ අංක 431 පරිදි විනය හේතුන් මත ස්ථාන මාරු කරන ලද වැඩ තහනම් කර හා සේවය අතහැර ගොස් නැවත සේවයේ පිහිටුවන ලද නිලධාරීන් සඳහා පොලිස් විද්‍යාලය මගින් ලබා දෙන ධාරිතා පුහුණු සංවර්ධන පාඨමාලාව සඳහා කිසිදු පිළිගත හැකි හේතුවක් නොමැතිව 2014.08.31 පැය 15.00 පෙර වාර්තා කරන ලෙස දැනුම් දුන් බවයි.

ඒ අනුව පැමිණිලිකරු විසින් තමා කිසිදු වරදක් සිදුකර නොමැති හෙයින් පුහුණුව අවලංගු කර ගැනීම සඳහා අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, පානම පොලිස් ස්ථානාධිපතිවරයාගේ නිර්දේශය අනුව ධාරිතා පුහුණුවට යොමුකල බව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විසින් පවසා සිටි බවද සඳහන් කර ඇත. කිසිදු වරදක් නොමැතිව ධාරිතා පුහුණු පාඨමාලාවට යොමු කිරීමෙන් පැමිණිලිකරු වෙත රු 30,000 ක පමණ අමතර මුදලක් වැයවූ බවද ආර්ථික මෙන්ම මානසික පීඩාවන් වලට ලක් වූ බවද පැමිණිල්ල මගින් සඳහන් කර ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-

මෙම පැමිණිල්ලට අදාලව 2014.12.28 දින ලිඛිත වාර්තාව මගින් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාර පො.කො. 29619 නිලධාරී සම්බන්ධව 4 වන වගඋත්තරකාර ස්ථානාධිපති (රථවාහන අංශය) විසින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත යොමු කරන ලද රහසිගත වාර්තාවක් මත මෙම පැමිණිලිකරු රථවාහන අංශයේ සිට සාමාන්‍ය රාජකාරි සඳහා මාරුකර ඇති බවත් චෝදනා එල්ල වූ මෙම පැමිණිලිකරු ඇතුළු නිලධාරීන් 9 දෙනෙකු ධාරිතා පුහුණුව සඳහා නිර්දේශ කර ඇති බවත්ය. තවද මෙම නිලධාරී සම්බන්ධයෙන් පොලිස් කොමිෂන් සභාවට යොමු කර ඇති පැමිණිල්ලකට අදාලව විභාගයක් පවත්වා ඇති බවත් සඳහන් කර ඇත.

එසේම පැමිණිලිකරු අදාළ ධාරිතා පුහුණුව සඳහා නිර්දේශ කරන ලද උ.පො.ප. යූ.පී. චන්ද්‍රකුමාර මහතා සඳහන් කර ඇත්තේ, මෙම නිලධාරී මහජනතාවට පීඩාකාරී අයුරින් හැසිරෙන බවත් ඒ සම්බන්ධයෙන් ඔහුට අවවාද කර ඇති බවත් පසුව මෙම නිලධාරියා සාමාන්‍ය රාජකාරි වල යොදවන ලද අතර පසුව සහකාර පොලිස් අධිකාරීගෙන් ලද වාචික උපදෙස් මත පැමිණිලිකරුගේ සුභසිද්ධිය සලකා ධාරිතා පුහුණුව සඳහා යොමු කරන ලද බවත්ය. එසේම මෙම නිලධාරියා සම්බන්ධයෙන් කිසිදු විනය පරීක්ෂණයක් සිදුකර නොමැති බවද දක්වා ඇත.

<u>මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ සිදුකරන ලද පරීක්ෂණයන්හිදී ඉදිරිපත් වී ඇති කරුණු :-</u>

පැමිණිලිකාර පො.කො. 29319 නිලධාරීට රාජකාරි කාලය තුළ කිසිදු විනය කඩකිරීම් සම්බන්ධ චෝදනාවක් එල්ල වී නොමැති බවත් පැමිණිලිකරුට එරෙහිව පොලිස් කොමිෂන් සභාව වෙත

ලැබී ඇති මහජන පැමිණිල්ලක් 2014.01.22 දින විභාග කිරීමට කටයුතු යොදා තිබුණද සාක්ෂිකරුවන් ඉදිරිපත් නොවීම මත පැමිණිලිකරු වරදකරු බවට පත්ව නොමැති බවත් එම පැමිණිල්ල මත පොලිස් අධිකාරීවරයා විසින් පැමිණිලිකරු මහජනයා හා ගැටෙන රාජකාරි වලින් ඉවත් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු ධාරිතා පුහුණුව සඳහා නිර්දේශ කල වගඋත්තරකාර උ.පො.ප. චන්ද්‍රකුමාර නිලධාරීවරයා මහජනයාට පීඩාවන ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරු වෙත චෝදනා එල්ල කලද එවැනි පැමිණිල්ලක් හෝ අවවාද කල බවට කිසිදු සටහනක් පැමිණිලිකරුට විරුද්ධව නොමැති බවද නිරීක්ෂණය වී ඇත.

පැමිණිලිකරු මහජනයා හා ගැටෙන රාජකාරි වලින් ඈත් කර සමීප අධීක්ෂණයට ලක්කරන ලෙස කරන ලද පොලිස් අධිකාරී නියෝගය අනුව 04 වන වගඋත්තරකරු විසින් පැමිණිලිකරු සමීප අධීක්ෂණය කිරීම අපහසු බැවින් ධාරිතා පුහුණුවට යොමුකර ඇති බවද නිරීක්ෂණය වේ.

මේ අනුව කිසිදු පිළිගත හැකි චෝදනාවකට වරදකරු නොවූ පැමිණිලිකරු විනය චෝදනා ඇති නිලධාරීන් සඳහා පවත්වන ධාරිතා පුහුණු සංවර්ධන වැඩසටහන සඳහා යොමු කර ඇති බව නිරීක්ෂණය වී ඇත.

නිගමනය :-

ඉහත සියලු කරුණු අනුව පැමිණිලි පාර්ශවය කිසිදු පළිගත හැකි චෝදනාවකට වරදකරු නොවී විනය චෝදනා ඇති නිලධාරීන් සඳහා පවත්වන ධාරිතා පුහුණු සංවර්ධන වැඩසටහන සඳහා යොමු කිරීමෙන් පැමිණිලි පාර්ශවය සමාන නිලධාරීන් අතරින් වෙනස්කමකට භාජනය කර ඇති බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කරන අතර. එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති නීතිය ඉදිරියේ සමානව සැලකුම් ලැබීමේ මූලික අයිතිවාසිකම වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

1. පැමිණිලිකරුට සිදුවූ අගතිය සම්බන්ධයෙන් රු. 10,000/- ක වන්දි මුදලක් පැමිණිලිකරු වෙත ගෙවීමට වගඋත්තර පාර්ශවය විසින් පියවර ගත යුතුය.

2. තවද ඉදිරියේදී මෙවැනි ක්‍රියාමාර්ග ගැනීමේදී වඩාත් සැලකිලිමත්ව අදාල තිරණ ගැනීමට පියවර ගත යුතු බවට වගඋත්තරකරුවන් වෙත අවධාරණය කරනු ලැබේ.

2019.09.02 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.